# ‘අපට ලොක්කන් නැතුවම බැරි ද?

## පශ්චාත් අරගල දේශපාලන සන්දර්භය පිළිබඳ මහජන අදහස්’ රැගත්

**නීතිය හා සමාජ භාරය විසින් ප්‍රකාශයට පත්කරනු ලැබූ ප්‍රකාශනය එළිදැක්වීමට සමගාමී ව 2023 මාර්තු 31 දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පැවැත්වුනු සාකච්ඡාවේ දී මෙලනි ගුණතිලක විසින් සිදුකළ අදහස් දැක්වීම**



> දැන් ආර්ථිකය කියලා කියන්නේ ඉස්සර පල්ලියේ භාෂාව වගේ. මොකද ඒ දේවල් ලියවෙන භාෂාව කියවන්න පුළුවන් කෙනෙක්ට විතරයි නේ ඒක කියවන්න පුළුවන්. දැන් මේ වෙලාවේ ආර්ථිකයත් ඒ වගේ. ඒක හරියට විෂය දන්න කෙනෙක්ට විතරයි ඒක කියවලා තේරුම් ගන්න පුළුවන්. ඒගොල්ලෝ ගන්න තීරණ අනිත් අය ශබ්ද නැතිව පිළි අරගෙන ඉන්න ඕනි. නමුත් අපි හිතලා බැලුවොත් ආර්ථිකය කියලා කියන්නේ අපි හැමෝගෙම ජීවිතවලට අති විශාල බලපෑමක් එල්ලවන දෙයක්. එහෙනම් ඇයි මේක හරිම සංකීර්ණ විෂයක් විදියට යම්කිසි පිරිසකට ලඝු වෙච්ච දැනුමක් වෙලා තියෙන්නේ? ඇයි මේක හැමදෙනාටම තේරුම් ගන්න බැරි ? ඒ වගේ ප්‍රශ්නත් අපි අහන එක වැදගත් කියලා මම හිතනවා.

අරගලය ඇයි තවදුරටත් කරන්නේ ? system change කියන එක වෙනුවෙන් අපි ගොඩක් දෙනා අරගලයට සම්බන්ධ වෙන්නෙ. අරගලයේ හිටපු සමහර කට්ටිය හරි අපිට IMF එක ආවා නම් හරි ආර්ථික ප්‍රශ්න විසඳිලා තියෙනවා, තෙල් ටික ගෑස් ටික ලැබිලා තියෙනවා මෙතනින් හරි කියලා යම් පිරිසක් නැවතුණාම තවත් පිරිසක් ඉදිරියට යන්න තීරණය කළා. ඒකේ දි පැහැදිලිව කිව්වා අපිට ක්‍රම වෙනසක් අවශ්‍යයි, system change එකක් අවශ්‍යයි කියලා. ඒකෙදි මං දකිනවා ලොකු ගැටලුවක් වෙලා තියෙනවා අපි මේ ඉන්න හැමදෙනාම ක්‍රමය මොකක් ද කියලා පැහැදිලිව හඳුනා ගෙන නැහැ කියන ගැටලුව. ක්‍රමය කියලා කියන්නේ මේ ප්‍රභූ පාලන තන්ත්‍රය විතර ද? මේ ප්‍රභූ පාලන තන්ත්‍රය කරන්නේ ඒගොල්ලන්ගේ අවශ්‍යතා සපුරා ගැනීමක් විතර ද? නැතිනම් ඒක එතනින් එහාට ගියපු තව විශාල පින්තූරයක් තියෙනවා ද? කියන එක වැදගත් කියලා මම හිතනවා, ඒ ගැන කතා කරන්න පුළුවන් නම්.

මම ආයේ පොඩ්ඩක් යන්න කැමතියි මේකෙදි මම බොහෝ දුරට කතා කරන විෂය, පරිසර අර්බුදය සම්බන්ධයෙන්, ගෝලීය පරිසර අර්බුදය සම්බන්ධයෙන්. ඒකෙදි පැහැදිලිව අපරාධකාරයෝ හඳුනා ගෙන තියෙනවා. සරලව කිව්වොත් මේ වෙද්දි පෘතුවියේ පැවැත්ම තර්ජනයට ලක්වෙලා තියෙනවා. පෘතුවියේ පැවැත්ම තර්ජනයට ලක්වෙනවා කියලා වැඩියෙන්ම පරිසර විනාශයට දායක වන සමාගම් 1970 ගණන්වල ඉඳලා දැනගෙන ඉඳලා තියෙනවා. රජයන් දැනගෙන ඉඳලා තියෙනවා. නමුත් මේ වෙනුවෙන් ක්‍රියාත්මක වුනේ නැහැ. ExxonMobil වගේ සමාගම් අරගත්තොත්, මේ සමාගම් මේවා ගැන දැනගෙන ඉඳලා ඒ සම්බන්ධයෙන් වෙන ක්‍රියාකාරකම් නවත්වන්න වැඩ කරලා තියෙනවා. එතකොට මේකේ හරි පැහැදිලිව තේරෙනවා මේ අපරාධ සිද්ධ වෙනවා. මේවා ලාභ විතරක් අරමුණු කරගන්න සමාගම්වල, ඒ කණ්ඩායම්වල අවශ්‍යතාවන් මත තමයි මේ පවතින ක්‍රමය දිගින් දිගටම පවත්වා ගෙන යන්නේ කියලා. එතකොට අපි බලය ප්‍රභූ තන්ත්‍රයෙන් වෙන පිරිසකට මාරු වුනොත්, ඒ මාරු වුණත් අපි කරගෙන යන්නේ මේ පවතින ආර්ථික ක්‍රමය ඇතුලේ නම් වෙනසක් වෙයි ද? එතකොට system change එකක් වෙනවා ද? මං හිතනවා ඒක ගැටලුවක් කියන එක. අපි ගොඩක් කල් හිතාගෙන හිටිය මේවා කුමන්ත්‍රණ න්‍යායවල් කියලා. 1% පිරිසක් ලෝකය පාලනය කරනවා, සමාගම් එකසිය ගණනක් ලෝකය පාලනය කරනවා කියලා. නමුත් දැන් මේ වෙනකොට මේවා facts. ඒ කියන්නේ මේවා ඔප්පු කරලා තියෙනවා. 2021 අවුරුද්ද ගත්තොත් එහෙම සම්පූර්ණ උපයපු ධනයෙන් 70% ගණනකට හිමිකම් කියන්නෙ

මේ ලෝකයේ ජනගහනයෙන් 1% ක්. ඉතිරි 99%ක් අතර බෙදිලා තියෙන්න ලෝක ධනයෙන් 30%ගණනක් විතරයි. මේ ගණනය කිරීම් බොහෝම ප්‍රසිද්ධයි. ඕනෑම කෙනෙකුට හොයාගන්න පුළුවන්කම තියෙනවා. එතකොට අපි ආපහු system change කියන තැනට ආවොත් මේ අසමානතාව නැති කරන්නේ කොහොම ද? නැති කරන්න පුළුවන් ද? එහෙම නැති නම් මේක ok ද? මේක කමක් නැද්ද?

system change කියන එක ගැන අපි කතා කරන්න පටන් ගත්තේ ගෝල්ෆේස් එකේදී "ගෝටා ගෝ හෝම්" කියන අදහසත් එක්කනේ. ඒ තේමාව යටතේ නේ අරගලය දිගින් දිගටම ගියේ. ඒක එතනින් එහාට system change කියන තැනට ආවේ ජූලි 22 ප්‍රහාරයත් එල්ල වෙන්න කලින්. ඒ කියන්නේ ජූලි 9-13 ඒ කාලය අතරතුර ගෝඨා ගිහිල්ලා, එත් ඇයි තවමත් අපි ඉන්නේ ? කියන ප්‍රශ්ණය මතුවුනා. ගෝල්ෆේස් එකේ හිටිය සමහර පිරිස් මාධ්‍ය නිවේදන නිකුත් කරලා කිව්වා අපි යනවා කියලා, ඒක සමාජ මාධ්‍ය හරහා, මාධ්‍ය හරහා ප්‍රචලිත කළා. එතකොට ඒ ගොල්ලන්ට කියන්න ඕනවුනේ අපි ආපු අරමුණ ඉෂ්ඨ වුණා අපි යනවා ගෙදර කියන එක.

තව දෙයක්. මේක ජූලි 9 මම අත්දැක්කා. පරිසර වැඩවලදී විතරක් නෙමේ සමාජ වැඩවලදී වුණත් මම මේක දැකලා තියෙනවා. මිනිස්සු ඇවිල්ලා අර ගොඩනැගිලි අත්පත්කර ගත්තාම, තමන් බදු මුදල් ගෙවලා නඩත්තු කරන දේවල් පාවිච්චි කරන්න ගත්තාම කට්ටියකට මේක දිරෙව්වෙ නැහැ. මේ පිරිස වැඩි දෙනෙක් ඉහළ මධ්‍යම පාන්තික පිරිස කිව්වොත් නිවරදියි, ඒගොල්ලන්ට මේක හරි ගියේ නැහැ, ඒ කියන්නේ ඒ අයට මේක දකින කොට දැනුනේ හරි අපහසුතාවයක්. මෙහෙම නෙමේ මේ දේවල් වෙන්න ඕනි. මේ බිල්ඩින්වල සංකේතාත්මක වටිනාකමක් තියෙනවා කියලා මේගොල්ලෝ හඳුනා ගෙන හිටියා. ඒ සංකේතවල ඒ වටිනාකමට හානි වෙනවා දකින්න ඒගොල්ලෝ කැමති වුනේ නැහැ.

ඉතිං මං මේක දකින්නෙත් පරණ වැඩවසම් ක්‍රමයේදී අපට යටත්විජිත වාදයත් එක්ක ලැබුණු ක්‍රමය ගැනීමේ කොටසක් ලෙස. අපි ඇත්තටම අසමානතාවය වෙනස් කරනවා නම් අපි අවධානය දෙන්න ඕනි මොනවටද? එතකොට අලුත් ආර්ථික ක්‍රමයක් ගේනවා නම් එතනදි අපි අවධානය යොමු කළ යුතු කරුණු මොනවා ද? එතකොට විශේෂයෙන් පරිසරය ගැන කිව්වොත් එහෙම තව පරම්පරා කිහිපයකට හරි ජීවත්වෙන්න පුළුවන් විදියේ පරිසරයක් නිර්මාණය කරන එක වැදගත් කියලා මම හිතනවා. එතනින් එහාට ගියාම පවතින ධනවාදි ක්‍රමය, අසමානතාවය මුල්කරගත් ක්‍රමය සම්බන්ධයෙන් අපේ පියවර මොකක්ද? ධනවාදය ඇතුලෙ අපේ සතුට එහෙම නැතිනම් අපි සතුට ලබන්න, එහෙම නැත්නම් අපි ජීවිතේ දෙයක් ලැබුවා කියලා හිතන්නේ තව තවත් මිලදි ගැනීම් කිරීමෙන්. ඒ මිලදී ගැනීම්වලින් පරිසරයට ඇති වන බලපෑම, ඒ මිලදි ගැනීම්වලින් ඇත්තටම අපේ මොළයට ඇති වන බලපෑම ගැන අපි හිතනවද?

දැන් මේ වෙනකොට භාණ්ඩ හා සේවා විකුණන්න පාවිච්චි කරන වෙළෙඳ ප්‍රචාරණ ක්‍රම දිහා බැලුවොත් මේවා පාවිච්චි කරන්නේ මිනිසුන්ගේ ඔලුවේ වැඩ කරනනේ brain chemicals පිලිබඳ අවබෝධයකින්. ඒ දැන්වීම් දකින වාරයක් පාසාම ඒකෙන් මොළයට යන සංඥාවක් තියෙනවා. මේ හැම දෙයක්ම ක්‍රියාත්මක වෙන්නේ මිනිසුන්ව පාවිච්චි කරලා එකෙන් ලාභ ලබා ගැනීම අරමුණින්. එතනදි වෙන්නෙ යම් පිරිස්, සමාගම් ලාභ ලබන එක. ආයේ මං system change කියන තැනට ආවොත් system change වෙනවා නම් මම විශ්වාස කරනවා ඒක වෙන්න ඕනි මේ තලයෙදි කියලා. මිනිස්සු සංවිධානය වෙන්න ඕනි කියලා මම විශ්වාස කරනවා. නමුත් සංවිධානය වෙන්න ඕනි හරි අරමුණක් යටතේ. දැන් අර කිව්වා වගේ මේ ක්‍රමය පැවතුනාට කමක් නැහැ කියලා හිතන කොහොමද ක්‍රමය වෙනස් කරන්න ඕනි ඒ අයත් එක්ක එකතුවෙන්න. එතකොට අපි ඉස්සරහට යන්නේ නැහැ. අපි නවතින්නේ එකම තැන. මොකද මේ දේවල් අපි මාස ගණනක් තිස්සේ අත්දකිනවා.

ගෝල්ෆේස් කණ්ඩායම් අතරේ වෙන සාකච්ඡාව අතරේත් මේක පොඩ්ඩක් එහෙට මෙහෙට ඇදෙන දෙයක්. එතකොට සංවිධානය වීමත් එක්කම මිනිස්සු තමන් අතට බලය ලබා ගැනීම නැතිනම් ක්‍රියාකාරී පුරවැසියෝ වෙන එක, අර කිව්වා වගේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට මිනිස්සු සහභාගි වෙන එක නොකරන්නේ ඇයි? ඇයි මිනිස්සු හිතන්නේ අපිට බැහැ කියලා. ඇයි හිතන්නේ මේක කරන්න අවශ්‍ය දැනුම මට නැහැ. මගේ අත්දැකීම් මේකට වැදගත් වෙන්නේ නැහැ. ඒ විදියට හිතන්නත් පොළඹවන්නේ අර තියෙන ක්‍රමය නඩත්තු කරගන්න ප්‍රභූ තන්ත්‍රය විසින්මයි. ඒක නඩත්තු කරගන්න ඒකට හදලා තියෙන ප්‍රතිරූපය හේතු වෙලා තියෙනවා කියලා මං හිතනවා. මොකද විශේෂයෙන් අපි දැනුම කියලා අරගත්තොත් එහෙම දැනුම ගැන ගොඩක් දෙනා හිතන්නේ අපිට වැඩියෙන් ඉහළින් තියෙන දෙයක්. අපිට ලබා ගන්න බැරි දෙයක් කියල. මේක අපි ගොඩක් මේ දවස්වල අත්දකිනවා ආර්ථිකය සම්බන්ධයෙන්. මොකද අපි ගොඩක් දෙනා ආර්ථිකය සම්බන්ධයෙන් අදහස් දක්වන්නේ නැහැ. මොකද ඒක ආර්ථික විද්‍යාඥයන්ට විතරක් කරන්න පුළුවන් දෙයක් කියල හිතල. නමුත් අපි හිතලා බැලුවොත් ආර්ථිකය කියලා කියන්නේ අපි හැමෝගෙම ජීවිතවලට අති විශාල බලපෑමක් එල්ලවන දෙයක්. එහෙනම් ඇයි මේක හරිම සංකීර්ණ විෂයක් විදියට යම්කිසි පිරිසකට ලඝු වෙච්ච දැනුමක් වෙලා තියෙන්නේ? ඇයි මේක හැමදෙනාටම තේරුම් ගන්න බැරි ? ඒ වගේ ප්‍රශ්නත් අපි අහන එක වැදගත් කියලා මම හිතනවා. මේක World Economist Forum එකෙදීත් කතා වෙලා තියෙනවා. දැන් ආර්ථිකය කියලා කියන්නේ ඉස්සර පල්ලියේ භාෂාව වගේ කියලා. මොකද ඒ දේවල් ලියවෙන භාෂාව කියවන්න පුළුවන් කෙනෙක්ට විතරයි නේ ඒක කියවන්න පුළුවන්. දැන් මේ වෙලාවේ ආර්ථිකයත් ඒ වගේ. ඒක හරියට විෂය දන්න කෙනෙක්ට විතරයි ඒක කියවලා තේරුම් ගන්න පුළුවන්. ඒගොල්ලෝ ගන්න තීරණ අනිත් අය ශබ්ද නැතිව පිළි අරගෙන ඉන්න ඕනි. මේ හැම දෙයක්ම ප්‍රශ්න කිරීමකට ලක්විය යුතුයි. මොකද මිනිස්සු තමන්ගේ අයිතිවාසිකම්

හඳුනගන්න කොට තමයි ජනතාවට බලය ලබා ගන්න පුලුවන් වෙන්නෙ. යම්කිසි පුද්ගලයෙකුට මූලික අවශ්‍යතා සපුරා ගැනීමට අයිතියක් තියෙනවා. මට මහ පොළවෙන් ලැබෙන පිරිසිදු හුස්ම, වතුර ලබා ගැනීමට මට අයිතියක් තියෙනවා. ඒ අයිතිය කවුරු හරි කඩ කරනවා නම් ඒ වෙනුවෙන් ඊට විරුද්ධව මම නැගී සිටිනවා. ඒ වෙනුවෙන් මම වැඩකරනවා කියන අවබෝධය ලබා ගැනීම වැදගත්.

තමන්ගේ අයිතිවාසිකම් කඩ වෙද්දි ඒවා කඩ වෙනවා කියලා මිනිසුන්ට හඳුනා ගැනීමට පුළුවන් වෙන්න නම් විශේෂයෙන් ආර්ථිකයේ දී, ආර්ථික අපරාධ හරහා මේ අයිතිවාසිකම් කඩ වෙන්නේ කොහොම ද කියන එක හඳුන ගන්න එක වැදගත් කියලා මම හිතනවා. මොකද අපි ගොල්ෆේස් අරගලය පටන් ගන්නකොට අපි දැක්කෙ ලයිට් ගෑස් නැති වෙච්ච එක, ඒ කියන්නෙ අපි දැක්කේ බොහෝම සීමිත අවශ්‍යතා දෙකක් නැතිවීම විතරයි. නමුත් ඒක එතනින් එහාට මිනිසුන්ගේ ජීවිත විතරක් නෙමේ මිනිසා කියන සත්ත්වයාගේ පැවැත්ම ම තර්ජනය වෙච්ච කාලයක තමයි අපි මේ ජීවත් වෙන්නේ. මේක වළක්වා ගන්න පුළුවන් කියලා විද්‍යාඥයෝ කියනවා. මේ සම්බන්ධයෙන් විශාල කතාබහක් තිබෙනවා. නමුත් ඒ දේවල්වලට ලැබෙන මධ්‍ය ආවරණය ඉතා අඩුයි. ගිය අවුරුද්දේ 2020 අප්‍රේල් කාලයේම විද්‍යාඥයෝ 2000ක් විතර ස්පාඤ්ඤයේ උද්ඝෝෂණය කළා. එතනදි දහස් ගණනක් අත්අඩංගුවට පත් වුණා. ඒගොල්ලන්ගේ ඉල්ලීම වුනේ අපි හැකි ඉක්මනට මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න ඕනි, ඒ ගන්න කටයුතු සාධාරණ වෙන්න ඕනි කියන එක. මොකද මේක සාධාරණ වෙන්න ඕනි කියන්නේ මිනිසුන්ගේ ජීවිත රකින්න කියලා, පරිසරය විතරක් ආරක්ෂා කරන්න ගිහින් මිනිසුන්ට පරිසරයත් එක්ක ජීවත් වෙන්න තියෙන අයිතිය අභියෝගයකට ලක්වෙන තැනක තමයි අපි මේ වෙලාවේ ජීවත් වෙන්නේ. ඉතිං අර ක්‍රම වෙනසක් කියද්දි ඒකත් එක්ක ආර්ථිකයට තියෙන ඉතාම තද බැඳීම හඳුන ගන්න එක වැදගත් කියලා මම හිතනවා. බලය එක කොටසකින් තව කොටසකට ගිහිල්ලා විතරක් හරි යන්නේ නැහැ. ඒ අලුතෙන් ලැබෙන කොටස ඇත්තටම මේ ආර්ථික ක්‍රමය වෙනස් කරන්න මිනිසුන්ගේ යහපැවැත්ම මුල්කර ගත් ආර්ථික ක්‍රමයකට මාරු වෙන්න අදාළ වැඩ පිළිවෙලක් කරයි ද කියන ප්‍රශ්නය අපි ඉස්සරහ තියෙනවා.



LAW & SOCIETY TRUST

**නීතිය හා සමාජ භාරය**
**අංක 03, කින්සි ටෙරස්,**
**කොළඹ 08,**
**ශ්‍රී ලංකාව**
**දුරකතන :+ 94 (0) 112684845**
**ෆැක්ස් :+ 94 (0) 112686843**
**admin@lstlanka.org**
**www.lstlanka.org**